# බෝම්බ නොතකා දුන් ජනවරම කොල්ලකෑම

සන්ධානයට පළාත් සභා මැතිවරණයෙන් විශිෂ්ට ජයක් ලැබී ඇති බව කුහකත්වයක් හා ආධානග්‍රාහී බවක් නැති ඕනෑම අයකු පිළිගත යුතු වෙයි. එක්සත් ජාතික පක්ෂයේ ජී. ඇල්. පීරිස් වැනි නඩු කතා නොකරන නීතිඥයන් හා ජාතික හෙළ උරුමයේ ඇතැම් මන්ත්‍රී හාමුදුරුවරු ජනමාධ්‍ය නියෝජිතයන් තමන් වෙත කැඳවා කියා සිටියේ සන්ධානය පරාජය වී ඇත යන්න ය. මන්ත්‍රී හාමුදුරුවරුනට එපමණක් කියා නැවතීමට නොහැකි බැවින් උන්වහන්සේලා එක්සත් ජාතික පක්ෂය ද පරාජය වී ඇති බව කීහ. එක්සත් ජාතික පක්ෂය පැරදී ඇති බව කවුරුත් දන්නා බැවින් උන්වහන්සේලා ද ජී. ඇල්. පීරිස් මහතා මෙන් ම අමුතුවෙන් කියා සිටියේ සන්ධානය පැරදී ඇති බව ය.

ජාතික හෙළ උරුමයට තමන් කවුද යන වග ටිකෙන් ටික හෝ හෙළිදරවුකිරීමට සිදුවෙයි. ඩේලි නිවුස් පුවත්පතට අනුව තිලක් කරුණාරත්න මහතා පක්ෂයේ සියළු ධුරවලින් ඉවත් වී සාමාන්‍ය සාමාජිකයකු ලෙස කටයුතු කරයි. ඒ මහතාට ඇතැම් මන්ත්‍රී හාමුදුරුවරුන් සමග ප්‍රශ්න ඇති බව ද ඒ පත්‍රය කියයි. ඒ කුමක් වුවත් අද තිලක් කරුණාරත්න මහතා ජාතික හෙළ උරුමයෙහි ජනතා මිතුරෝ කණ්ඩායම හා අසපු කණ්ඩායම විසින් නිෂ්ක්‍රීය කෙරී ඇති බව නම් පැහැදිලි ය. අසපු කණ්ඩායමේ උඩුවේ ධම්මාලෝක හිමියන් හා කොළොන්නාවේ සුමංගල හිමියන් කුමක් කීව ද සන්ධානයට පක්ෂ නොවන බව කවුරුත් දනිති. උන්වහන්සේලා දෙනම සෝම හාමුදුරුවන් අපවත්වීමෙන් පසු දේශපාලනයට තල්ලු කරනු ලැබූ භික්ෂූන් වහන්සේ වෙති. මේ කණ්ඩායම් දෙක අතර ඇති පොදු සාධකය නම් ජනතා විමුක්ති පෙරමුණු විරෝධයයි. මේ කණ්ඩායම් දෙක එකතු වී තිලක් කරුණාරත්න මහතා නිෂ්ක්‍රීය කර ඇති නමුදු නුදුරු අනාගතයේ දී ඒ කණ්ඩයම් අතර නායකත්ව අරගලයක් ඇතිවනු ඇත. ඒ සමග ජාතික හෙළ උරුමය ද පක්ෂයක් ලෙස නිෂ්ක්‍රීය වනු ඇත.

එක්සත් ජාතික පක්ෂය මෙන් ම ජාතික හෙළ උරුමය ද පළාත් සභා මැතිවරණයේ ප්‍රතිඵල නිකුත් වූ සැණින් පුවත්පත් සාකච්ඡා පවත්වා සන්ධානය පරාජය වී ඇති බව ලොවට හෙළිදරවු කිරීමට යොදාගත් තර්කය වූයේ මෙවර ජනතාව ඡන්දය දීමේ දී එතරම් උද්‍යොගයක් දක්වා නැත යන්න ය. මෙය නිවැරදි තර්කයක් නො වෙයි. කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්දය දුන් ප්‍රතිශතය පණහට අඩුවුව ද අනුරාධපුරය පොළොන්නරුව වැනි දිස්ත්‍රික්කවල එය හැත්තෑවක් පමණ විය. සමස්තයක් ලෙස ගත්කල ඡන්දය දුන් ප්‍රතිශතය හැටක් පමණ විය. පළාත් සභා මැතිවරණවල දී සාමාන්‍යයෙන් ජනතාව ඡන්දය දීමට මැලිකමක් දක්වයි. සාමාන්‍යයෙන් ගත්කල සිංහල බෞද්ධ ප්‍රතිශතය වැඩි දිස්ත්‍රික්කවල ඡන්දය දීමේ ප්‍රතිශතය ද වැඩි විය. අද ඡන්දය දීමට පක්ෂයක් නැත්තේ විශේෂයෙන් ම සිංහල නොවන අයට බව පළාත් සභා මැතිවරණයෙන් පැහැදිලි විය.

පළාත් සභා මැතිවරණයට දින කිහිපයකට පෙර කොල්ලුපිටියේ බෝම්බ පිපිරීමක් සිදුවිය. එය ඩග්ලස් දේවානන්දට වඩා මැතිවරණය ඉලක්ක කරගෙන පුපුරවන ලද්දක් විය. කරුණාට ඇත්තේ දේවානන්ද දේශපාලනය නැගෙනහිර පළාතේ කරගෙන යෑමේ අවස්ථාව පමණ ය. ඔහුට ප්‍රභාකරන් පරාජය කිරීමේ හැකියාවක් නොතිබුණි. එහෙත් ඔහු ප්‍රභාකරන්ට එල්ල කරන ලද අභියෝගය මගින් කියා සිටි දේ වැදගත් ය. ප්‍රභාකරන් දෙමළ ජනයාගේ එකම නියෝජිතයා නොවන බවත්, නැගෙනහිර පළාත උතුරු පළාතෙන් වෙනස් බවත්, උතුරු හා නැගෙනහිර පළාත් සමජාතිය නොවන බවත්, ඒ පළාත් දෙක එකම ඒකයක් ලෙස ගැනීමට නොහැකි බවත්, ඔහු පෙන්වා දුන්නේ ය. දේවානන්ද, කරුණා හා ආනන්ද සංගරී යනු ප්‍රභාකරන්ට අභියෝගයක් බවට පත් වී ඇති දෙමළ දේශපාලනඥයෝ වෙති. ඔවුන් හරහා දෙමළ ජනයාට යම්කිසි ආකාරයක ප්‍රජාතන්ත්‍රීය දේශපාලනයක් ලබාදීමට කටයුතු කිරීම සන්ධාන ආණ්ඩුවේ වගකීමක් වෙයි.

ප්‍රභාකරන් මැතිවරණයට කලින් බෝම්බ පිපිරවීමෙන් අපේක්ෂා කෙළේ සිංහලයන් බියගැන්වීම ය. සන්ධාන ආණ්ඩුව යටතේ ඊනියා සාමයක් නැති බවත් සාමයෙන් සිටීමට නම් එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙන ලෙසත් ඔහු බෝම්බයෙන් දුන් පණිවුඩය විය. එහෙත් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය හා කිහිප දෙනකුට හැරෙන්නට සන්ධානයට ඡන්දය දුන් කිසිවකුටවත් ඊනියා සාමය ප්‍රශ්නයක් නොවන්නට ඇත. (කුමාරතුංග මහත්මිය ඡන්දය දෙන්නේ සන්ධානයට යැයි උපකල්පනය කෙරෙයි. ඇගේ කියුම් කෙරුම් අනුව නම් ඒ එසේ යැයි සිතීමට ඇති ඉඩකඩ ඉතා අඩු

© Prof. Nalin De Silva

ය.) සිංහලයන්ගෙන් බහුතරය ප්‍රභාකරන්ගේ බෝම්බය, කුමාරතුංග මහත්මියගේ වනවලින් නම්, සත පහකටවත් ගණන් නොගත්තෝ ය. සිංහලයන් බහුතරයට විශේෂයෙන් ම කොළඹින් හා ප්‍රධාන නගර කිහිපයෙන් පිට ජීවත්වන සිංහලයන්ට අවශ්‍ය වන්නේ ඊනියා සාමයක් නොව ලංකාව ඒකීය රටක් ලෙස පවත්වාගෙන යෑම ය. කුමාරතුංග මහත්මියට මෙන් ම සන්ධානයේ ඇතැමුන්ට ද නොතේරෙන කරුණ එය වෙයි. අද සිංහලයන් බහුතරයකට ප්‍රධාන ප්‍රශ්නය වී ඇත්තේ දෙමළ ජාතිවාදය පරාජය කිරීම ය. ඔවුන්ට ආර්ථික ප්‍රශ්න වැදගත් නොවනවා නො වෙයි. එහෙත් අද ආර්ථිකයට වඩා දෙමළ ජාතිවාදය ඔස්සේ එන දේශපාලනයත් සංස්කෘතික යටත්විජිතවාදයත් වැදගත් වෙයි. පංතිය හා ආර්ථිකය ගැන කතාකරන මාක්ස්වාදයට ජාතිය යන්න දේශපාලනයෙහි වැදගත් සාධකයක් වීම පශ්චාත්ව්‍යුහවාදී අල්තුසර් හරහා පෙනෙන්නේ අධිනිශ්චය වීමක් (ඕවර ඩිටර්මින්ඩ්) ලෙස ය. අධිනිශ්චය යන සංකල්පය මෙරට බෙහෝ දෙනා තේරුම් ගෙන නැති සංකල්පයක් බව ඔවුන් ලියන කියන දෙයින් පෙනීයයි. එක් ඊනියා පශ්චාත්නූතනවාදී විචාරකයකු පසුගිය දා මොකක් දෝ එකක් තමන්ගේ සිතෙහි අධිනිශ්චය වී ඇති බව කියා ඇත. අධිනිශ්චය යන්න අල්තුසර්ගේ අර්ථයෙන් ගත්කල එක එකාගේ සිත්වල ඇතිවන්නක් නො වෙයි. අල්තුසර්ට අධිනිශ්චය අවශ්‍ය වූයේ මාක්ස්වාදයේ බංකොලොත් බව නිසා ය. බටහිර භෞතික විද්‍යාඥයෝ කිසි දිනෙක තමන්ගේ ප්‍රවාදවල නැති සංකල්ප අධිනිශ්චය වී ඇතැයි නොකියති.

පසුගිය මැතිවරණ කිහිපයක ම ඡන්දය දී ඇති ආකාරය විශ්ලේෂණය කරන විට පෙනී යන කරුණක් නම් සිංහලයන්ගෙන් විශේෂයෙන් ම සිංහල බෞද්ධයන්ගෙන් බහුතරය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට, ජනතා විමුක්ති පෙරමුණට හා මහජන එක්සත් පෙරමුණට ඡන්දය දෙන බව ය. මේ පක්ෂ අද වන විට පණස්හයේ දරුවන්ගෙන් සමන්විත වෙයි. පණස්හයේ දරුවෝ යනු ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෝ පමණක් ම නොවෙති. ඒ බව අප කියන්නේ 1989 සිට ය. එහෙත් ඒ සංකල්පය බොහෝ දෙනා යොදාගන්නේ ජනතා විමුක්ති පෙරමුණ හා සම්බන්ධයෙන් පමණකි. කෙසේ වෙතත් පසුගිය මැතිවරණ කිහිපයක ප්‍රතිඵල නිරීක්ෂණයෙන් පසුව පණස්හයේ දරුවන් එකතුවිය යුතු බව අපි කීවෙමු. කොළඹ, මහනුවර හා තදාසන්න ප්‍රදේශවල ඕල්කට් බෞද්ධ මතවාද තරමක් ශක්තිමත් බැවින් ඒ ප්‍රදේශවල ජාතික හෙළ උරුමය වැනි පක්ෂයකට සුළු ඉඩකඩක් ලැබෙන මුත් එය සිංහල බෞද්ධයන් බහුතරයේ දේශපාලනය නො වෙයි. ඕල්කට් බෞද්ධයන්ට රෝම ලන්දේසි නීතිය, බටහිර වෛද්‍ය විද්‍යාව මෙන් ම බුද්ධාගම ද, එනම් ඕල්කට් බුද්ධාගම ද, ප්‍රැක්ටිස් කළ හැකි වෙයි. එහෙත් සිංහල බෞද්ධයන්ට එය එසේ නො වෙයි. සිංහල බුද්ධාගම, ඇත්තටම සිංහල ථෙරවාදී බුදුසසුන, යනු සිංහල බෞද්ධයන්ගේ ජීවිතයෙන් වෙන් කෙරුණු ඊනියා ආගමක් නො වෙයි. සිංහල බුද්ධාගම යන්න පහළොස්වැනි සියවසේ ලියැවුණු තායි (සියම්) කෘතියක ද දක්නට ලැබෙයි. (නොබෝදා මා අතට පත් වූ මේ කෘතියෙහි ඉංගිරිසි පරිවර්තනයෙහි සිංහල බුඩිසම් ලෙස යෙදී ඇත්තේ සිංහල ථෙරවාදී බුදු සසුන යන අර්ථයෙන් විය යුතු ය. දකුණු ඉන්දියාවෙන් ථෙරවාදී සසුන තුරන් වී යෑමෙන් පසුව ලෝකයේ ථෙරවාදී බුදු සසුනේ මධ්‍යස්ථානය නැත්නම් මහගෙදර, ඉංගිරිසි පරිවර්තනය අනුව හෝම් ඔෆ් බුඩිසම්, වී ඇත්තේ ලංකාව ය.)

ඉතා සුළු කරුණක දී වුව ද පුවත්පත් සාකච්ඡා පවත්වන එක්සත් ජාතික පක්ෂයට හා ජාතික හෙළ උරුමයට බෝම්බ පිපිරවීමෙන් පසුව ඒ ගැන සාකච්ඡාවක් කැඳවීමට නො හැකිවිය. ජාතික හෙළ උරුමය දින කිහිපයක් ගත වී මැතිවරණ ප්‍රතිඵල නිකුත්වීමෙන් ද පසුව ඒ පිළිබඳ ප්‍රකාශයක් කර තිබුණි. මේ අතර ඡන්ද ප්‍රතිඵල විග්‍රහ කරමින් කුමාරතුංග මහත්මිය පවසා තිබුණේ ඒ ඊනියා සාමකතා සඳහා ලැබුණු ජනවරමක් බව ය. එක්සත් ජාතික පක්ෂය ඉන් පසු ප්‍රකාශයක් කරමින් ආණ්ඩුව අන්තර්පාලනය පදනම් කරගනිමින් සාකච්ඡා අරඹන්නේ නම් තම සහාය දෙන බව කියා ඇත. මේ කොටි බෝම්බ නොතකමින් සන්ධානයට ඡන්දය දුන් ජනතාවගේ ජනවරම කොල්ලකෑමට තැත්කිරීමකි. කුමාරතුංග මහත්මිය දැන් අවුරුදු ගණනක් තිස්සේ කරන්නේ ජනවරම තම පුද්ගලික දේශපාලන න්‍යාය පත්‍රය වෙනුවෙන් කොල්ලකෑම ය. දෝන කතිරිනා මෙන් ම ඇය ද ඇගේ බටහිර ස්වාමිවරුන්ට එරෙහි ව නොයයි. දෝන කතිරිනාගේ අභිමතය කුමක් වුව ද ඇය යොදා ගනිමින් ජාතික අවශ්‍යතාවය ඉටුකිරීමට එදා විමලධර්මසූරිය කෙනෙක් විය. එතුමා මියගොස් මේ වසරට අවුරුදු හාරසීයක් ගතවෙයි. තවත් විමලධර්මසූරිය කෙනකු නැතිකමේ පාඩුව අද කවදාටත් වඩා තදින් දැනෙයි. කේවල විමලධර්මසූරිය කෙනකු නැතිනම් සාමූහික ව හෝ කුමාරතුංග මහත්මියට ඊනියා සාමයක් වෙනුවෙන් ජනවරම කොල්ලකෑමට ඉඩ නොදිය යුතු වෙයි ~

© Prof. Nalin De Silva